**ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කරන ලද සුනාමියෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ නැවත ගොඩනැංවීමේ ව්‍යාපෘතිය - "සී" සංරචකය (මාර්ග පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය) - 2012**

**1. මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ප්‍රදාන සහ ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.7,891,486 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.8,134,637,007 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම් පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් -පිරිවැයට/මා.සං.අ. පවරන ලද | (2,293,733) | 33,270,523 | 33,154,603 |
| නිම වූ සිවිල් වැඩ/පවරන ලද | (11,183,542) | 54,417,380 | 7,122,198,101 |
| පරිපාලන පිරිවැය | 21,211,102 | 20,794,442 | 277,129,238 |
| උපදේශක සේවා | 157,659 | 25,321,009 | 702,155,065 |
| | 7,891,486 | 133,803,354 | 8,134,637,007 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමක් මෙහෙයවා නොතිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

## 3.1 ගිණුම්කරණ අඩුපාඩු

2011 වර්ෂයේදී ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් නිම වී ඇතත් සහ උපදේශකවරුන් විසින් 2011 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමේ වාර්තාව නිකුත් කර ඇතත්, 2010 වර්ෂයේ ඉදිකිරීම් සම්පූර්ණ වූ රු.3,522,570 ක් වූ රඳවාගත් මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 4.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය හා අරමුදල් උපයෝජනය පිළිබඳ සමහර වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| | ප්‍රදාන/ණය ගිවිසුම් අනුව සැපයීමට එකඟ වූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය සඳහා | 2012 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ. ඩොලර් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ. ඩොලර් මිලියන | රු.මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | | | | | | |
| ප්‍රදාන | 55.2 | 5,531.4 | - | - | 59.8 | 6,668.60 |
| ණය | 4.0 | 400.8 | - | - | 3.7 | 416.50 |
| ශ්‍රී ලංකා රජය | 14.3 | 1,432.9 | 32.3 | 32.27 | 14.5 | 1,034.87 |
| එකතුව | 73.5 | 7,365.1 | 32.3 | 32.27 | 78.0 | 8,119.97* |

* උපචිත වියදම් සඳහා ගිණුම්කරණයන් හේතුවෙන්, වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා සමග මෙම සංඛ්‍යා එකඟ නොවේ.

## 5. භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතියේ උපදේශක විසින් 2011 මාර්තු මාසයේදී ඉදිරිපත් කළ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාව අනුව, මාතර දිස්ත්‍රික්කයේ දුර කි.මී. 13.95 ක් වූ මාර්ග හතරක් හැර ජාතික මාර්ග 5 ක්ද අනෙකුත් ප්‍රාදේශීය මාර්ගද පුනරුත්ථාපනය කිරීමට ප්‍රදානය කළ කොන්ත්‍රාත්, 2011 අප්‍රේල් මාසය අවසාන වන විට සම්පූර්ණ කර තිබුණි.

බෝගහවැව - පුල්මුඩේ මාර්ගය, ත්‍රිකුණාමලය - පුල්මුඩේ සහ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි යන මාර්ගවල 2011 වසරේ ගංවතුර මගින් ඇති වූ හානි නැවත පිළිසකර කිරීම් වැඩ කටයුතු රු.53,682,521 ක් වූ පිරිවැයකට සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබූ බව නිරීක්ෂණය විය.

## 6. ව්‍යාපෘතියේ කටයුතු වසා දැමීම

ආසියානු සංවර්ධන බැංකුව 2010 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මගින් දී තිබුණු උපදෙස් අනුව, 2010 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කලයුතු වූ අතර 2011 මාර්තු 31 දිනට පෙර සියළුම අදාල වියදම් ඉල්ලුම්කර ආපසු ගෙන තිබිය යුතුය. තවද, 2011 මැයි මාසයේදී උපදේශකවරුන් විසින් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ වාර්තාවද ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘති කාලය අවසානයේදී අදාල පාර්ශවයන් වෙත ව්‍යාපෘතියේ ගිණුම් ඇවර කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වශයෙන් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ උපදෙස් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමේ ඒකකයේ කාර්යාල කටයුතු 2012 ජූලි 31 දින තෙක් ක්‍රියාත්මක වී තිබුණි. මූලා‍ය ප්‍රකාශන අනුව මහාභාණ්ඩාගාරයෙන් ලද අරමුදල් වලින් රු.986,192 ක් වූ වැටුප් මෙම කාලපරිච්ඡේදය සඳහා ගෙවා තිබුණි.